# නරියාගේ රජකම



දම්සාරි  නුවිනා දිසානායක

# නරියාගේ රජකම

දම්සාරි නුවිනා දිසානායක

# නරියාගේ රජකම

කර්තෘගේ නම : දම්සාරි නුවිනා දිසානායක.

කෘතිය පලකරන දිනය :2025.02.08

කතෘගේ වෙනත් කෘති :පළමු දිගහැරීම

පාසල :මහාමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පන්තිය :6-G

ISBN අංකය-978-624-208-644-6

# පිදුම

කුඩා කල සිට මා හදාවඩාගත්

මාගේ මෑණියන් සහ පියාණන්ටත්,

මා හට අකුරු කියා දුන් සියලු ගුරු

මෑණිවරුන් සහ පියවරුන්ටත්,

පවුලේ සැමටත්,

දැනට මා

ඉගෙනුම ලබන 6-G පන්තියේ

කුමුදුනී ජයවර්දන ගුරු මෑණියන්ටත්,

පොත් ලියන්නට සහය දුන්

මාගේ ආදරණීය නැගණියටත් මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මණින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ද කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

**විදුහල්පතිනිය,**
**ශශිකලා සේනාධීර,**
**මහමායා බාලිකා විද්‍යාලය -මහනුවර**


එකමත් එක කාලෙක කැලෑවේ ලොකු රාජධානියක් තිබුණා. ඒ රාජධානියේ රජකම් කලේ සිංහයෙක්.දවසක් දා සිංහයා කැලේට ගියා පොඩ්ඩක් පාඩුවේ ඉන්න කියලා.




ඒ වෙලාවේ ම නරියෙක් ගමට ගිහින් කුකුළෙක් අරගෙන එද්දී ,එයාගේ කකුලේ,බිම තිබ්බ රතු පාට තීන්ත ටිකක් ගෑවුණා. ඒක දැකපු නරියට  අපූරු අදහසක් ආවා.  ඒ කැලයේ රජකම් කරන්න.



ඉතින් එයා විවේක ගනිමින් හිටපු රජතුමා ළගට ගිහින් මෙහෙම කිව්වා."අයියෝ මාව බේරගන්න.කවුරුහරි මට උදවු කරන්න......."ඉතින් මේක ඇහිලා රජතුමා ගිහින් මොකක්ද ප්‍රශ්නය කියල ඇහුවා."අනේ මේ බලන්න මගේ කකුල තුවාල වෙලා ලේ ගලනවා......අනේ කරුණාකරලා මට උදවු කරන්න......"නරියා කිව්වා . "ඔයා මගේ ගුහාවේ නවතින්න" රජතුමා නරියට කිව්වා . "නෑ....නෑ....ඔයා මාව ඔයාගේ උපදේශකයා කරගන්න.......මන් ගොඩක් දේවල් දන්නවා........" නරියා කිව්වා.



නරියා දන්නවා ඒ වෙලාවට අලියා නානවා කියල. නරියෝ හරිම කපටියි නේ.....ඉතින් නරියා කිවුවා. “ඔන්න දැන් මෙතනට වැස්සක් වහියි....” එතකොටම අලියා වතුර දාගද්දී මේ දෙන්න ඉන්න පැත්තටත් වැස්සක් වගේ වතුර වැටුණා.



රජතුමා දන්නේ නෑ අලියා මේ වෙලාවට නානවා කියල.ඉතින් එයා කිවුවා,“ඔව්මයි නරියෝ.. ඔයා ගොඩක් දේවල් දන්නවා.ඔයා තමයි මගේ අලුත් උපදේශකයා ..... එන්න,දැන් අපි මගේ ගුහාවට යමු........”නරියා රජතුමාත් එක්ක ගුහාවට ගියා.



ඔන්න ඉතින් දැන් නරියත් රජතුමාගේ ගුහාවේ ඉදන්,රජතුමා දඩයම් කරන දේවල් කාලා,රජතුමා යමක් අහන්න ආවහම කටට එන දෙයක් කියල ඉන්නවා.එහෙම කාලය ගතවෙද්දී රජතුමාට උණ හැදුනා.ඉතින් නරියට හිතුන මේක තමයි කැලේ රජකම ගන්න හොදම වෙලාව කියලා.



ඊට පස්සේ එයා කැලේට ගිහින් අනෙක් හැම සතෙක්ටම ඇහෙන්න මෙහෙම කිවුවා "අහන්න...අහන්න. අහන්න...අහන්න......අපේ රජතුමා උණ වගේ ඉන්නේ බොරුවට. එයා අපිව කාලා දාන්න කුමන්ත්‍රණ කරනවා.... අපි එයාව රජකමින් අයින් කරන්න ඕනේ..මේ බලන්න එයා මාව කන්න හදලා මගේ කකුලත් තුවාල වෙලා." කියලා එයා එයාගේ තීන්ත ගෑවුන කකුල පෙන්නුවා.



“අනේ අපොයි!” අනිත් සත්තු කිවුවා. “එහෙනම් දැන් ඔයා තමයි අපේ රජා.” අනිත් සත්තු කිවුවා.ඔන්න ඉතින් දැන් නරියා රජවෙලා,හොදට සැපට ඉන්නවා. කාලයක් යද්දී එයා අනිත් සත්තුන්ට කිවුවා,හැමදාම එයාව බලන්න එන්න ඕනේ කියලා.ඒ හැම වෙලාවෙම එයාට කන්න මොනවහරි ඕනේ කියලා නීතියකුත් දැම්මා....දැන් එයාට පවන් ගහන්නත් හාවෝ දෙන්නෙක් ඉන්නවා.




ටික දවසක් යද්දී එයා අලියා නාන තැනට ආවා . ඒ වෙලාවෙත් අලියා නානවා. එතකොටම වැස්සක් වගේ වතුර ඇවිත්,නරියාගේ කකුලේ තිබ්බ තීන්ත ටික හේදිලා ගියා.ඔන්න ඉතින් හොරේ අහුවුණා.සත්තු හැමෝම එකතුවෙලා නරියාව කැලෙන් පන්නලා දැම්මා.



ඊට පස්සේ ඒගොල්ලෝ සිංහයා ළඟට ගිහින් සමාව ඉල්ලලා,එයාව ආයෙත් රජා කරගත්තා. සිංහයාගේ උණත් හොඳ වුණා. ඊට පස්සේ ඒගොල්ලෝ සතුටින් හිටියා.මේ හැමදෙයක්ම බලන් හිටපු බකමූණා කිවුවා,

"හැමදාමත් බොරු කරන්න බෑ"



නිමි!

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දීපීබෙළු තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**

**සෙනවිරත්න මහලේකම්.**

ISBN අංකය-978-624-208-644-6